SC

# මහා වාරිමාර්ග ව්‍යාපාරයන්හි ගොවි සංවිධානවල කාර්යභාරය පිළිබඳව අධ්‍යයනයක්

## ( ගිරිතලේ මහා වාරිමාර්ග ව්‍යාපාරය ආශ්‍රිතව )

2002/2003 සමාජ විද්‍යාපති උපාධිය
සඳහා ඉදිරිපත් කරනු ලබන
ස්වාධීන නිබන්ධනය

විභාග අංකය :- S/G/2001/452/R
අධ්‍යයන වර්ෂය :- 2002/2003

භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 602 |
| වර්ග අංකය | |

## සාරාංශය

ශ්‍රී ලංකාව පුරා දැනට මහා වාරිමාර්ග ව්‍යාපාර 32 ක් පමණ ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපාර ගොවිජන පදනම් ආරම්භ කරන ලද්දේ සංවර්ධන ව්‍යාපෘති වශයෙනි. එහිදී රජය අරමුණු රාශියක් අපේක්ෂා කරනු ලැබුව ද, පසුව එහි පදිංචි කරවන ලද ගොවීහු විවිධ ගැටළු වලට මුහුණ පෑහ. මීට විසඳුමක් ලෙස මෙම ව්‍යාපාර ප්‍රදේශවල පදිංචි කරවන ලද ජනතාව සංවර්ධන ක්‍රියාදාමයන්ට සහභාගි කරවීම තුලින් මෙම ගැටළු අවම කරගත හැකි බව රජය විසින් කල්පනා කරන ලදී. ඒ අනුව ගොවි සංවිධාන පිහිටුවා ඒ තුලින් ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීමට රජය අපේක්ෂා කරන ලදී. වර්තමානය වන විට මෙම ගොවි සංවිධාන ලබා ඇති සාර්ථක අසාර්ථකභාවය පිළිබඳ කරුණු හුවා දැක්වීම මෙම නිබන්ධනය තුලින් අපේක්ෂා කෙරේ.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.

පළමු පරිච්ඡේදයේ දී අධ්‍යයනයට ලක්කරනු ලබන්නේ අධ්‍යන ගැටළුව, අධ්‍යයනයේ වැදගත්කම. අධ්‍යයන අරමුණු, අධ්‍යයන ක්‍රමවේදය, අධ්‍යයන ප්‍රදේශය හැඳින්වීම හා අධ්‍යයන සීමාකම් හා ගැටළුයි.

දෙවැන්නේ දී ගොවි සංවිධාන සංකල්පයේ ආරම්භය හා විකාශය පිළිබඳ කරුණු සොයා බැලේ. එහිදී ගොවි සංවිධානවල අපේක්ෂිත කාර්ය, එහි ජීව්‍යතාව, ව්‍යාපාරය තුලින් බිහිවුණු ගොවි සංවිධාන ගොඩනැගීමේ අත්දැකීම්, වාරිමාර්ග කළමණාකරණ අංශය පිහිටුවීම හා ඒකාබද්ධ වාරිමාර්ග කළමණාකරණ වැඩසටහන පිළිබඳව කරුණු ඉදිරිපත් කෙරේ.

තෙවැන්නේ දී, ගොවි සංවිධාන සංකල්පය ආසියානු කලාපීය වාරි පද්ධතියට යොදාගෙන ඇති ආකාරය පිළිබඳව කරුණු සොයා බැලේ. ඒ අනුව ඉන්දියාව, පාකිස්ථානය, පිලිපීනය, මැලේසියාව, තායිලන්තය හා ඉන්දුනීසියාව යන රටවල් ගොවි සංවිධාන සංකල්පය වාරි පද්ධතිය කළමණාකරණය කිරීමට යොදාගෙන ඇති අයුරුත් එහි සාර්ථකත්වය පිළිබඳවත් කරුණු හඳාරනු ලබයි.

සිව්වැනි පරිච්ඡේදය අධ්‍යයනයේ වැදගත්ම කොටසයි. ගොවි සංවිධාන පිහිටුවීමේ අරමුණු, එහි සාර්ථක අසාර්ථක භාවය ගිරිතලේ නම් වූ අධ්‍යයන ප්‍රදේශය තුල දැකගැනීමට ඇති ආකාරය පිළිබඳව සවිස්තරාත්මකව කරුණු ඉදිරිපත් කෙරේ. ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය වාරි පද්ධති කළමණාකරණයට, යොදා ගෙන ඇති අයුරු ආසියානු කලාපීය වාරි කළමණාකරණ අත්දැකීම් ශ්‍රී ලංකාවේ වාරිමාර්ග කළමණාකරණ අත්දැකීම් හා සැසඳීම, ගිරිතලේ ව්‍යාපාරයේ ගොවි සංවිධාන බිහිවීම, පමණක් නොව, ගොවි සංවිධාන ක්‍රියාකාරීත්වය, ගොවි ආදායමට බලපාන ආකාරය, ඉදිරි වෙළඳ ගිවිසුම් වලට බලපාන ආකාරය, සුභසාධනයට බලපාන ආකාරය, කාන්තා දායකත්වයට හා

පවුලේ පෝෂණයට බලපාන ආකාරය, ගොවි නිෂ්පාදනයට බලපාන ආකාරය, රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ සම්බන්ධ කර ගන්නා ආකාරය හා එමගින් ගොවි සංවිධාන කලාපය තුල වෙසෙන ගොවීන්ට ඔවුන්ගේ ජීවන තත්වය උසස්කර ගැනීමට ප්‍රතිලාභ ලබාගන්නා ආකාරය පිළිබඳව කරුණු දීර්ඝ වශයෙන් සාකච්ජා කෙරේ. මෙම නිබන්ධයේ පුරා පිටු 63 ක් පුරාම මේ පිළිබඳව සාකච්ජාවට බඳුන් කෙරේ. ලබාගන්නා ලද ක්ෂේත්‍ර දත්ත අධ්‍යයන අරමුණු හා ගැලපීමක් කරනු ලබයි.

අවසාන වශයෙන් පස්වන පරිච්ජේදය තුලින් අපේක්ෂා කරන්නේ ඉහත සිව්වැන්නෙන් ලබාගත් තොරතුරු මත හිද ඒවා පදනම් කර ගනිමින් ගොවි සංවිධානවල ක්‍රියාකාරීත්වය අනාගත ක්‍රියාකාරීත්වය හා සැසඳීමයි. අධ්‍යයනයෙන් ලබාගත් නිගමන හා යෝජනා සාරාංශ කොට ඉදිරිපත් කර ඇති අතර, මහ ගොවි ජනපද ව්‍යාපාරවල ස්ථාපිත කර ඇති ගොවි සංවිධාන වල ඉදිරි දැක්ම වැඩ කෙසේ සකස්විය යුතුද ජනපද ලාභීන්ට මෙම ගොවි සංවිධාන ඔවුන්ගේ ජීවන තත්වය උසස් කර ගැනීමට කෙසේ ඉවහල් කරගත හැකිද, එහි දැනට පවතින අඩුපාඩු හා සාර්ථක තැන් උකහා ගනිමින් ඉදිරියේ සකස්විය යුතු ආකාරය පිළිබඳව කෙටියෙන් කරුණු විග්‍රහ කර ඇත.

13 JU